DOI: 10.31357/fhssmst.2015.00102

# කාන්තාවන් සවිබලගැන්වීම සඳහා ගැමිදිරිය ව්‍යාපෘතියේ දායකත්වය

## (තෙල්ලඹුර ක්ෂේත්‍ර මෙහෙයුම් ප්‍රදේශය ඇසුරින්)

චතුරි මධුභාෂිණී කොඩිතුවක්කු

15 SEP 2016

උපදිෂ්‍ය ශාස්ත්‍රපති 2015

# කාන්තාවන් සවිබලගැන්වීම සඳහා ගැමිදිරිය ව්‍යාපෘතියේ දායකත්වය

## (තෙල්ලඹුර ක්ෂේත්‍ර මෙහෙයුම් ප්‍රදේශය ඇසුරින්)

චතුරි මධුභාෂිණී කොඩිතුවක්කු

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ උපදිෂ්‍ය ශාස්ත්‍රපති පරීක්ෂණය

සඳහා භූගෝල විද්‍යා විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධනයයි.

## අපේක්ෂකයාගේ ප්‍රකාශය

මේ ශාස්ත්‍රීය නිබන්ධනය මහාචාර්ය සුනේත්‍රා තෙන්නකෝන් මහත්මියගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්ව විද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

2016-09-15 ....................

දිනය

.................................

අත්සන

## උපදේශකගේ සහතිකය

මෙම අපේක්ෂිකාව විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, නිබන්ධයට අදාළව 2016.06.16 දින පවත්වන ලද වාචික පරීක්ෂණයේදී පරීක්ෂකවරු විසින් ඉදිරිපත් කළ සංශෝධන නියමිත පරිදි සකස් කොට ඇතුළත් කර ඇති බවත්, මෙම නිබන්ධය උපදිෂ්ඨ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ ඇගැයීම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමි.

2016/09/15
........................
දිනය

........................................
මහාචාර්ය සුනේත්‍රා තෙන්නකෝන්
භූගෝල විද්‍යා අධ්‍යයනාංශය

# පටුන

| | පිටු අංකය |
|---|---|
| පටුන | i - v |
| ප්‍රස්තාර නාමාවලිය | vi - vii |
| වගු නාමාවලිය | vii - viii |
| රූපසටහන් නාමාවලිය | ix |
| සිතියම් නාමාවලිය | ix |
| කෙටි යෙදුම් | x |
| ස්තූතිය | xi |
| සාරාංශය | xii - xiii |
| **පළමුවන පරිච්ඡේදය - හැඳින්වීම** | **01 - 17** |
| 1.1 අධ්‍යයනය හැඳින්වීම | 01 - 08 |
| 1.2 අධ්‍යයන ගැටලුව | 08 - 11 |
| 1.3 අධ්‍යයනයේ වැදගත්කම | 11 - 15 |
| 1.4 අධ්‍යයනයේ අරමුණ | 15 -16 |
| 1.5 අධ්‍යයනයේ සීමා හා ගැටලු | 16 - 17 |
| **දෙවන පරිච්ඡේදය - කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ න්‍යායන් හා සංකල්ප** | **18 - 77** |
| **2.1** සවිබලගැන්වීම | 18 - 27 |
| 2.1.1 නිර්වචන (Definitions) | 18 - 25 |

2.1.2 සවිබලගැන්වීමේ ආකාර (Ways of Empowerment) 25 - 26

2.1.3 සවිබලගැන්වීමේ මුලයන් (Elements of Empowerment) 27

**2.2** කාන්තාවන් සවිබලගැන්වීම (Women Empowerment) 28 - 77

2.2.1 නිර්වචන (Definitions) 28 - 33

2.2.2 කාන්තාවන් සවිබලගැන්වීමේ ප්‍රස්තුථයන් හෙවත් අරමුණු (Women Empowerment Propositions) 34 - 35

2.2.3 කාන්තාවන්සවිබලගැන්වීමේ වර්ගීකරණයන් (Categories of WomenEmpowerment) 35

2.2.4 කාන්තාවන් සවිබලගැන්වීමේ ක්‍රියාවලිය (The Process of Women Empowement) 36 - 38

2.2.5 කාන්තාවන් සවිබලගැන්වීමේ චර්යාධර්ම (Tenets of women Empowement) 38 - 40

2.2.6 කාන්තාවන් සවිබලගැන්වීමේ ප්‍රවේශයන් (Approaches of Women Empowerment) 40 - 43

2.2.7 කාන්තාවන් සවිබලගැන්වීම හා සම්බන්ධ න්‍යායන් හා සංකල්පීය රාමු (Theories & Conceptual Frameworks of Women Empowement ) 43 - 48

2.2.8 කාන්තාවන් සවිබලගැන්වීමේ දෘෂ්ටිකෝණයන් (Aspects of Women Empowerment) 48 - 54

2.2.9 කාන්තාවන් සවිබලගැන්වීම මැනීම (Measuring Women Empowerment) 55 - 70

2.2.10 කාන්තාවන් සවිබලගැන්වීමේ ව්‍යාපෘති පිළිබඳ හැඳින්වීම 70 - 77

**තුන්වන පරිච්ඡේදය - අධ්‍යයන ක්‍රමවේදය** **78 - 98**


**3.1.** අධ්‍යයන ප්‍රදේශය තෝරාගැනීම 78 - 79

**3.2.** අධ්‍යයන ප්‍රදේශයේ භෞතික, සමාජ හා ආර්ථික පසුබිම. 79 - 91

3.2.1. පිහිටීම 79 - 80

3.2.2. භූවිෂමතාව 80

3.2.3. දේශගුණය හා ජලවහනය 82

3.2.4. සමාජ පසුබිම 82 - 88

3.2.4.1 ජනගහනය 82 - 84

3.2.4.2 අධ්‍යාපනය 84 - 85

3.2.4.3 ආර්ථික තොරතුරු 85 - 87

3.2.4.4 ඉඩම් පරිහරණ රටාව 88

3.2.5 යටිතල පහසුකම් 89 -91

3.2..5.1 නිවාස පහසුකම් 89

3.2.5.2 ජල පහසුකම් 89 - 90

3.2.5.3 සෞඛ්‍ය පහසුකම් 90 - 91

3.2.5.4 මහාමාර්ග හා ප්‍රවාහන පහසුකම් 91

**3.3** නියදිය තෝරා ගැනීම 91 - 93

**3.4** දත්ත රැස් කිරීමේ ක්‍රම ශිල්ප 94 - 98

3.4.1. ද්විතීයික දත්ත රැස් කිරීම 94 - 95

3.4.2. ප්‍රාථමික දත්ත රැස් කිරීම 95 - 98

3.5 දත්ත විශ්ලේෂණය හා ඉදිරිපත් කිරීම 98

**සිව්වන පරිච්ඡේදය - කාන්තාවන් සවිබලගැන්වීම සඳහා ගැමිදිරිය ව්‍යාපෘතියේ දායකත්වය** **99 - 149**

**4.1** ගැමිදිරිය ව්‍යාපෘතියට පෙර හා පසු අධ්‍යයන ප්‍රදේශයේ ප්‍රතිලාභී කාන්තාවන්ගේ ආර්ථික, සමාජීය හා තීරණ ගැනීමේ තත්ත්වය 99 - 123

4·1·1 ගැමිදිරිය ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර හා පසු අධ්‍යයන ප්‍රදේශයේ ප්‍රතිලාභී කාන්තාවන්ගේ ආර්ථික තත්ත්වය 101 - 110

4.1.2 ගැමිදිරිය ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර හා පසු අධ්‍යයන ප්‍රදේශයේ කාන්තාවන්ගේ සමාජීය තත්ත්වය 110 - 118

4.1.3 ගැමිදිරිය ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර හා පසු අධ්‍යයන ප්‍රදේශයේ කාන්තාවන්ගේ තීරණ ගැනීමේ තත්ත්වය 118 - 123

**4.2** ගැමිදිරිය ව්‍යාපෘතියට සම්බන්ධ වූ හා නොවූ කාන්තාවන් අතර ආර්ථික, සාමාජීය හා තීරණ ගැනීමේ තත්ත්වය සංසන්දනාත්මකව 123 - 137

4.2.1 ගැමිදිරිය ව්‍යාපෘතියට සම්බන්ධ වූ හා නොවූ කාන්තාවන්ගෙන් ආර්ථික තත්ත්වය සංසන්දනාත්මකව 126 - 130

4.2.2 ගැමිදිරිය ව්‍යාපෘතියට සම්බන්ධ වූ හා නොවූ කාන්තාවන්ගේ සමාජීය තත්ත්වය සංසන්දනාත්මකව 121 - 135

4.2.3 ගැමිදිරිය ව්‍යාපෘතියට සම්බන්ධ වූ හා නොවූ කාන්තාවන්ගේ තීරණ ගැනීමේ තත්ත්වය සංසන්දනාත්මකව 136 - 137

**4.3** ගැමිදිරිය ව්‍යාපෘතිය කාන්තාවන් සවිබලගැන්වීම සඳහා යොදා ගෙන ඇති ක්‍රමෝපායන් පරීක්ෂා කිරීම. 138 - 144

**4.4** ගැමිදිරිය නිලධාරි මණ්ඩලය හා ප්‍රතිලාභී කාන්තාවන් මුහුණ දෙන ගැටලු 144 - 149

4.4.1 ගැමිදිරිය නිලධාරි මණ්ඩලය මුහුණ දෙන ගැටලු 144 - 147

4.4.2 ගැමිදිරිය ප්‍රතිලාභී කාන්තාවන් මුහුණ දෙන ගැටලු 147 - 149

**පස්වන පරිච්ඡේදය - නිගමන හා යෝජනා 150 - 156**

5.1 නිගමන 150 - 154

5.2 යෝජනා 154 - 156

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 157 - 160**

**උපග්‍රන්ථය 161 - 178**

# ප්‍රස්තාර නාමාවලිය


| ප්‍රස්තාර අංකය | | පිටු අංකය |
|---|---|---|
| 3.1 | ඌරල පහළ ජනගහනය වයස් කාණ්ඩ අනුව | 83 |
| 3.2 | ඌරල පහළ ජනතාවගේ රැකියාවන්හි බෙදීයාම | 86 |
| 3.3 | ආදායම් කාණ්ඩ අනුව පවුල් ප්‍රමාණය | 87 |
| 4.1 | ගැමිදිරිය ප්‍රතිලාභී කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම | 99 |
| 4.2 | ප්‍රතිලාභී කාන්තාවන් ගැමිදිරිය ව්‍යාපෘතියට සම්බන්ධ වී ගතවී ඇති කාලය | 100 |
| 4.3 | ගැමිදිරිය ඉතිරි කිරීමේ ක්‍රමය හෝ ජීවන මාර්ග ව්‍යාපෘතිය තුළින් කාන්තාවන්ගේ ආර්ථිකයේ සිදුවී ඇති වෙනස්කම් | 107 |
| 4.4 | ගැමිදිරියට අමතරව වෙනත් සමිති සංගම් සඳහා කාන්තාවන්ගේ සහභාගිත්වයේ ස්වභාවය | 111 |
| 4.5 | ගැමිදිරියට පෙර හා පසු ගමේ සමිති සංගම් මගින් පවත්වන රැස්වීම්වලට සහභාගී වීම | 112 |
| 4.6 | ගැමිදිරියට පෙර හා පසු කාන්තාවන් රැස්වීම්වල අදහස් ප්‍රකාශ කිරීමේ ස්වභාවය | 114 |
| 4.7 | කාන්තාවන් ගැමිදිරිය ව්‍යාපෘතියට සම්බන්ධ නොවීමට හේතු | 124 |
| 4.8 | ගැමිදිරියට සම්බන්ධ නොවූ කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම | 125 |
| 4.9 | ගැමිදිරියට සම්බන්ධ නොවූ කාන්තාවන් ගමේ සමිති, සංගම් සඳහා සහභාගී වන අකාරය | 131 |

4.10 ගැමිදිරියට සම්බන්ධ නොවූ කාන්තාවන් සමිති සංගම්වල රැස්වීම් සඳහා සහභාගී වන ආකාරය 133

## වගු නාමාවලිය


| වගු අංකය | | පිටු අංකය |
|---|---|---|
| 2.1 | විවිධ පුද්ගලයන් හා ආයතන ඉදිරිපත් කර ඇති කාන්තාවන් සවිබලගැන්වීමේ මාන | 54 |
| 2.2 | CASHE වැඩසටහන සඳහා භාවිතයට ගත් දර්ශක | 63 - 66 |
| 2.3 | Malhothra ගේ සවිබලගැන්වීමේ දර්ශක | 67 - 69 |
| 3.1 | තෙල්ලඹුර ක්ෂේත්‍ර මෙහෙයුම් කාර්යාලය මඟින් සමාගම් ශ්‍රේණිගත කර ඇති ආකාරය | 79 |
| 3.2 | අධ්‍යාපන මට්ටම අනුව ජනගහනය | 85 |
| 3.3 | ඌරල පහළ වසමේ ඉඩම් පරිහරණ රටාව | 88 |
| 3.4 | ඌරල පහළ වසමේ ඇති නිවාස වර්ග | 89 |
| 3.5 | ඌරල පහළ වසමේ ජල සැපයුම් මූලාශ්‍ර | 90 |
| 3.6 | ඌරල පහළ වසමේ මූලික තොරතුරු | 91 |
| 3.7 | කාන්තාවන් ණය ලබා ගෙන ඇති විවිධ ජීවනෝපාය ව්‍යාපෘති | 92 |
| 3.8 | සමස්ත නියැදිය | 93 |
| 4.1 | ගැමිදිරිය ව්‍යාපෘතියට පෙර හා පසු කාන්තාවන් ඉතිරි කර ඇති ප්‍රමාණය | 103 |

4.2 ගැමිදිරිය ව්‍යාපෘතියට පෙර හා පසු විවිධ ව්‍යාපෘති සඳහා කාන්තාවන් ණය ලබාගෙන ඇති ආකාරය. 105

4.3 ගැමිදිරියට පෙර හා පසු කාන්තාවන් තමා ඉතිරි කළ හෝ උපයාගත් මුදලින් භාණ්ඩ මිලදී ගෙන ඇති ආකාරය 109

4.4 ගැමිදිරියට පෙර හා පසු කාන්තාවන් රැස්වීම්වල අසුන් ගන්නා ආකාරය 116

4.5 ගැමිදිරියට පෙර හා පසු කාන්තාවන් ගමේ ක්‍රියාත්මක පොදු වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා සහභාගිවන ආකාරය 117

4.6 ගැමිදිරියට පෙර හා පසු කාන්තාවන් නිවසේදී තීරණ ගන්නා ආකාරය 119

4.7 ගැමිදිරියට පෙර හා පසු කාන්තාවන් තනිව තීරණ ලබා දුන් හෝ තීරණ ගත් අවස්ථා 120

4.8 ගැමිදිරියට පෙර හා පසු ගමේ සමිති හෝ සංගම් මගින් පවත්වන රැස්වීම්වලදී තීන්දු තීරණ ලබා දී ඇති ආකාරය 122

4.9 ගැමිදිරියට සම්බන්ධ නොවූ කාන්තාවන් මුදල් ඉතිරි කර ඇති ප්‍රමාණය 127

4.10 ගැමිදිරියට සම්බන්ධ නොවූ කාන්තාවන් තමා ඉතිරි කළ මුදලකින් හෝ උපයාගත් මුදලකින් භාණ්ඩ මිලදී ගෙන ඇති ආකාරය 130

4.11 ගැමිදිරියට සම්බන්ධ නොවූ කාන්තාවන් ගමේ ක්‍රියාත්මක වූ පොදු වැඩසටහන්,ව්‍යාපෘති සඳහා සහභාගී වී ඇති අකාරය 135

4.12 ගැමිදිරියට සම්බන්ධ නොවූ කාන්තාවන් තනිව තීරණ ලබා දුන් හෝ තීරණගත් අවස්ථා 136

4.13 ඌරල පහළ ගැමිදිරිය සමාගම සඳහා පත්වී ඇති නිලධාරී මණ්ඩලය 139

## රූපසටහන් නාමාවලිය


| රූපසටහන් අංකය | | පිටු අංකය |
|---|---|---|
| 2.1 | Mayox ගේ කාන්තාවන් සවිබලගැන්වීමේ ආකෘතිය. | 53 |
| 2.2 | කාන්තා සංවර්ධන ව්‍යාපෘති චක්‍රය | 72 |
| 4.1 | ගැමිදිරිය ව්‍යාපෘතියට සම්බන්ධවීමට පෙර කාන්තාවන්ගේ ඉතිරි කිරීමේ මාධ්‍ය | 102 |
| 4.2 | ගැමිදිරියට සම්බන්ධනොවූ කාන්තාවන්ගේ ඉතිරි කිරීමේ මාධ්‍ය | 126 |


## සිතියම් නාමාවලිය


| | | |
|---|---|---|
| 3.1 | අධ්‍යයන ප්‍රදේශය | 81 |

# කෙටි යෙදුම්

| | | | |
|---|---|---|---|
| 1. | CENWOR | - | Center for Women's Research |
| 2. | CIDA | - | Canadian International Development Agency. |
| 3. | ECOSOC | - | The Economic and Social Council of the United Nations. |
| 4. | ESCAP | - | Economic and Social Commission for Asia and the Pacific. |
| 5. | EU | - | Europian Union |
| 6. | ICSC | - | International Centre for Sustainable Cities. |
| 7. | IFUW | - | International Federation of University Women. |
| 8. | POPIN | - | United Nations Population Information Network. |
| 9. | PPFA | - | The Planned Parenthood Federation of America |
| 10. | RRWO | - | The Ruhunu Rural Women's Organization. |
| 11. | UNFPA | - | United Nations Population Fund. |
| 12. | UNGC | - | United Nations Global Compact. |
| 13. | UNHCHR | - | United Nations High Commissioner for Human Rights. |
| 14. | UNIFEM | - | United Nations Development Fund for Women. |
| 15. | USAID | - | United States Agency for International Development. |
| 16. | WCJF | - | Women Centre of Jamaica Foundation. |
| 17. | WEF | - | World Economic Forum |
| 18. | WHO | - | World Health Organization |

# ස්තුතිය

කාන්තාවන් සවිබලගැන්වීම සඳහා ගැමිදිරිය ව්‍යාපෘතියේ දායකත්වය පිළිබඳව තෙල්ලඹුර ක්ෂේත්‍ර මෙහෙයුම් ප්‍රදේශය ඇසුරින් සිදුකරනු ලැබූ මෙම පර්යේෂණයේ ඇති වැදගත්කම පිළිබඳව මා දැනුවත් කරමින්, ආරම්භයේ සිටම ඊට අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් ලබාදෙමින් මෙම පර්යේෂණ නිබන්ධයේ උපදේශකවරයා ලෙස කටයුතු කර මහාචාර්ය සුනේත්‍රා තෙන්නකෝන් මහත්මිය වෙත ප්‍රථමයෙන් මාගේ කෘතඥතාවය පිරිනමමි.

එමෙන්ම මෙම පර්යේෂණ කාර්යය සාර්ථක කර ගැනීම සඳහා ගැමිදිරිය ව්‍යාපෘතිය පිළිබඳව තොරතුරු ලබා දුන් කොළඹ ගැමිදිරිය පදනමේ තරුණ සංවර්ධන හා රැකියාගත කිරීම් ව්‍යාපෘති නිලධාරී එල්.අයි අවන්ති මහත්මියටද, ගාල්ල ගැමිදිරිය දිස්ත්‍රික් කාර්යාලයේ දිස්ත්‍රික් කණ්ඩායම් නායක,කේ. ජයමුනි මහතාටද, ඌරල පහළ වසම භාරව කටයුතු කළ නාමල් රණසිංහ මහතාටද මාගේ විශේෂ ස්තුතිය පිරිනමමි. එමෙන්ම ගාල්ල ඉඩම් පරිහරණ හා සැලසුම් කාර්යාලයේ ඉඩම් සංවර්ධන නිලධාරී නිලන්ති මහත්මියටද, නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන සහකාර ජයන්ති මහත්මියටද, ඌරල පහළ වසම භාර ග්‍රාම නිලධාරී ලීලාවතී මහත්මියටද, ගැමිදිරිය සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුලු නිලධාරී මණ්ඩලයටද, අවශ්‍ය තොරතුරු සපයා දෙමින් දැක්වූ සහයෝගය මෙහිදී සිහිපත් කිරීම යුතුකමක් ලෙස සලකමි.

එමෙන්ම අවශ්‍ය දත්ත හා තොරතුරු සපයා දෙමින් මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා සහය දුන්, ඌරල පහළ ගැමිදිරිය සමාගමේ ප්‍රතිලාභී කාන්තාවන්ටද, ඔවුන්ගේ පවුල්වල සාමාජික සාමාජිකාවන්ටද, ගැමිදිරියට සම්බන්ධ නොවූ කාන්තාවන්ටද, එම දත්ත හා තොරතුරු ලබාගැනීමට යාමේදී සහය වූ ගැමිදිරිය ප්‍රජා සම්පත් දායිකා සුනේත්‍රා මහත්මියටද මෙහිදී මාගේ විශේෂ ස්තුතිය පිරිනමමි. අවසාන වශයෙන් මෙම පර්යේෂණය පරිගණක ගත කිරීමේදී නිබඳ සහය ලබාදුන් මේකලා සොයුරියටද, නිරන්තරයෙන් මා දිරිමත් කරන මාගේ දෙමව්පියන්ට හා නන් අයුරින් සහයෝගය දැක්වූ සියලු දෙනා වෙතද මාගේ කෘතඥතාවය පළකර සිටිනු කැමැත්තෙමි.

# කාන්තාවන් සවිබලගැන්වීම සඳහා ගැමිදිරිය ව්‍යාපෘතියේ දායකත්වය (තෙල්ලඹුර ක්ෂේත්‍ර මෙහෙයුම් ප්‍රදේශය ඇසුරින්)

චතුරි මධුභාෂිණී කොඩිතුවක්කු

සාරාංශය

1960 දශකයෙන් පසුව විවිධ න්‍යායයන් හරහා ගොඩනැගී ඇති සවිබලගැන්වීම යන සංකල්පය ඔස්සේ කාන්තාවන් සවිබලගැන්වීම යන සංකල්පයද බිහිවී ඇත. කාන්තාවන් සවිබලගැන්වීම සඳහා විවිධ සංවිධාන, ව්‍යාපෘති හරහා විවිධ වැඩසටහන් ලෝකය පුරා ක්‍රියාත්මක කරනු ලබයි. ලංකාව තුළ ක්‍රියාත්මක ගැමිදිරිය ව්‍යාපෘතියද මෙරට දරිද්‍රතාවය අවම කිරීම සඳහා කාන්තාවන් කෙරෙහි වැඩි අවධානය යොමුකරමින් ක්‍රියාත්මක වන ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතියකි.කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ විවිධ පර්යේෂණ සිදුකර තිබුණද මෙහිදී කාන්තාවන්ගේ ආර්ථික, සමාජීය හා තීරණ ගැනීම යන අංශ තුන ඔස්සේ අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරාගත් ඌරල පහළ වසමේ කාන්තාවන් සවිබලගැන්වීමට ගැමිදිරිය ව්‍යාපෘතිය දායකවේදැයි විමර්ශනය කිරීම මූලික අරමුණ වේ.

ශාස්ත්‍රීය පර්යේෂණයක් සිදුකිරීමේදී බහුලව භාවිතා කරනු ලබන මූලික ක්‍රමවේදයන් වන දත්ත රැස්කිරීම, විග්‍රහකිරීම,විවිධ දත්ත විශ්ලේෂණ ක්‍රම භාවිත කරමින් මෙම පර්යේෂණ නිබන්ධය ප්‍රධාන අංශ කිහිපයක් ඔස්සේ සකස්කර ඇත. පර්යේෂණය පිළිබඳ හැඳින්වීම, පර්යේෂණ ගැටලුව, අධ්‍යයනයේ වැදගත්කම, අරමුණු, අධ්‍යයනයේ සීමා හා ගැටලු යනාදිය පළමුවන පරිච්ඡේදයෙන්ද, දෙවන පරිච්ඡේදයෙන් සවිබලගැන්වීම හා කාන්තාවන් සවිබලගැන්වීමේ න්‍යායාත්මක සංකල්පයන්ද, තුන්වන පරිච්ඡේදයෙන් අධ්‍යයන ක්‍රමවේදයද, සිව්වන පරිච්ඡේදයෙන් අධ්‍යයනයෙන් සොයාගන්නා ලද කරුණුද, පස්වන පරිච්ඡේදයෙන් නිගමන හා යෝජනාද ඉදිරිපත්කර ඇත.

ගැමිදිරිය ව්‍යාපාතිය කාන්තාවන් ආර්ථික, සාමාජීය හා තීරණ ගැනීම යන සියලු අංශවලින් සවිබලගැන්වීමට දායක වී ඇති බව අධ්‍යයනයේදී අනාවරණය විය. විශේෂයෙන්ම ගැමිදිරිය

සාමාජිකත්වයෙන් 62%ක් කාන්තාවන්ට ලබා දීම මෙන්ම ප්‍රධාන තීරණ ගන්නා තනතුරුවලින් 67%ක් හා අනෙකුත් කුඩා කණ්ඩායම් නායකත්වය සඳහා 68%ක් ලෙස කාන්තාවන් පත් කිරිම, රැස්වීම් වාර ගණන වැඩි කිරිම, විවිධ වැඩමුළු පැවැත්වීම, ගැමිදිරිය බැංකු ක්‍රමය හරහා කාන්තාවන්ගේ ඉතිරි කිරිම් වර්ධනය කිරීම, ජීවන මාර්ග ව්‍යාපෘති ණය හරහා කාන්තාවන්ගේ ආදායම් මාර්ග දියුණු කිරීම හා ඇති කිරීම, අයසටපත් අයට මුදල් ප්‍රදානයන් සිදු කිරීම යන ක්‍රමෝපායන් ඒ සඳහා බලපා තිබේ.

තවද ගැමිදිරිය ව්‍යාපෘතිය තුළ ගැටලු රාශියක් ද උද්ගත වී ඇති බව අනාවරණය විය. ඒ අතර සාමාජිකයින් රැස් කිරීමේ ගැටලු, ණය ලබාදීමේදී ඇති වී තිබෙන ගැටලු, මූල්‍ය ගැටලු, නිලධාරීන්ට මතු වී ඇති ගැටලු ලෙසත්, ණය සම්බන්ධ ගැටලු, නිලධාරීන් සම්බන්ධ ගැටලු හා වැඩමුළු පැවැත්වීම ඇනහිටීම සාමාජිකයින් මුහුණ දී ඇති ගැටලු ලෙසත් හඳුනා ගන්නා ලදි. එහිදි මේ ගැටලු වැඩි වශයෙන් ඇති වීමට බලපා ඇත්තේ මේ වන විට උෟරල පහළ ගැමිදිරිය සමාගම ග්‍රාමීය සංවිධානයක් ලෙස ගොඩනැගීම නිසා තෙල්ලඹුර ක්ෂේත්‍ර මෙහෙයුම් කාර්යාලය වසා දැමීමට තීරණය කිරීමත්, ඒනිසා එය භාරව කටයුතු කල නිලධාරියාගේ අවධානය අඩුවිමත්ය. කාන්තාවන් සවිබලගැන්වීම ලෝකය තුළ වැදගත් සංකල්පයක් ලෙස බිහිවී ඇති වකවානුවක ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය හා තීරණ ගැනීම යන අංශ වලින් කාන්තාවන් සවිබලගැන්වීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීමේදී මෙම පර්යේෂණය ඒ සඳහා දායක වනු ඇත.

**ප්‍රමුඛ පදඃ** කාන්තාවන් සවිබලගැන්වීම, ගැමිදිරිය ව්‍යාපෘතිය, තීරණ ගැනීමේ ක්‍රියාවලිය